**72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව**
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 අප්‍රේල් 19
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 12:01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රින් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya


# මාර්තු මාසයේ ඡන්ද මනාප වල සුළු වෙනසක්, ජා.ජ.බ./ජ.වි.පෙ ස.ජ.බ. ට වඩා පැහැදිලි ලෙස ඉදිරියෙන් සිටියි, එ.ජා.පයේ නැගිටීමේ ලකුණක් පෙන්නුම් කරයි

*2023 මාර්තු IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම.*

2023 මාර්තු මාසයේ නවතම ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණ (SLOTS) ඡන්දමතය විමසීමෙන් පෙබරවාරි මාසයේ සිට සුළු වෙනසක් සිදුව ඇති බව පෙන්නුම් කරයි, අපේක්ෂිත ඡන්දදායකයින්ගෙන් 41% ක් ජා.ජ.බ. / ජ.වි.පෙ. සඳහා වන අතර එය ස.ජ.බ.හි 30%ට වඩා පැහැදිලි ලෙස ඉදිරියෙන් සිටියි. එ.ජා.ප සඳහා සහය ලකුණු දෙකකින් ඉහළ ගොස් 6% දක්වා වැඩි විය. දෝෂයේ මායිම තුළ වුවද, මෙය සැබෑ වැඩිවීමක මූලික සංඥාවක් විය හැකිය.




ජා.ජ.බ./ජ.වි.පෙ. ඡන්දදායකයින්ගේ උද්යෝගය මඳක් පසුගාමී වී ඇති අතර, එමඟින් ස.ජ.බ. සමඟ තිබූ පරතරය සමස්ත අපේක්ෂිත ඡන්දදායකයින්ට සාපේක්ෂව 2% ක අඩු විමක් පෙන්නුම් කරයි.




2023 මාර්තු මාසයෙන් අවසන් වූ මාස හතර තුළ, පළාත් මට්ටමින් මනාපවල සුළු වෙනසක් සිදුව ඇත. සබරගමුව පළාතෙහි ජා.ජ.බ./ජ.වි.පෙ ස.ජ.බ.ව අභිබවමින් පැහැදිලි ලෙස ඉදිරියට පැමිණ ඇති අතර, ඌව පළාතෙහි දෙපාර්ශවයම සම මට්ටමක සිටියි.

SLOTS ප්‍රධාන විමර්ශක සහ IHP විධායක අධ්‍යක්ෂ ආචාර්ය රන්නන්-එළිය මහතා අදහස් දක්වමින් කියා සිටියේ මෑත කාලීන IMF ගිවිසුමෙන් SLOTS පාරිභෝගික විශ්වාසයේ යම් ප්‍රකෘතියක් පෙන්නුම් කිරීම පුදුමයට කරුණක් වුවද, මාර්තු මත විමසීම කෙරෙහි එහි කිසිදු පැහැදිලි බලපෑමක් නොපෙන්වන බවයි. නමුත් මෙම අවස්ථාවේදී පෙන්නුම් කරනු ලබන යම් වෙනස්කමක් ඉතා කුඩා විය හැකි බැවින් එය SLOTS නියැදිය මගින් නොපෙන්විය හැකි බව අවධාරණය කළේය.

**පෙර වාර්තාවන් ihp.lk වෙතින් ලබා ගත හැකිය.**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජනවාරි, “2023 ජනවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: ජා.ජ.බ/ජ.වි.පෙ සහ ස.ජ.බ ඡන්දදායකයින් අතර කරට කර සටනක්”, SLOTS වාර්තාව #2023-03. https://ihp.lk/publications/docs/SLOTSReport202303.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 පෙබරවාරි, “2023 පෙබරවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: ජා.ජ.බ./ජ.වි.පෙ., ස.ජ.බ. සහ දෙ.ජා.ස. වටා වැඩි ඡන්දදායකයින් ප්‍රමාණයක් ඒකරාශී වී ඇති අතරම එයින් ජා.ජ.බ./ජ.වි.පෙ. පැහැදිලි ලෙසම පෙරමුණ ගනී.”, SLOTS වාර්තාව #2023-06. https://ihp.lk/publications/docs/SLOTSReport202306.pdf යෙන් ලබා ගත හැකිය

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. IHP විසින් යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 මාර්තු MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 521ක් සහ 2021 අගෝස්තු 31 සිට 2023 අප්‍රේල් 9 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 10,601ක් මත පදනම් වන අතර ජා.ජ.බ. / ජ.වි.පෙ, ස.ජ.බ. සහ ශ්‍රී.ල.නි.ප.සඳහා 4-5%ක සහ අනෙකුත් පක්ෂ සඳහා 1-3%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. මීට පෙර සිදුකල යාවත්කාලීන කිරීමට වඩා මාර්තු යාවත්කාලීන කිරීමේදී නවතම දත්ත කට්ටලය භාවිතා කරන බැවින්, පෙර මාස සඳහා ඡන්ද ඇස්තමේන්තු අගයන්හි සුළු වෙනස්කම් සිදු ව ඇත. මීට අමතරව, ආකෘතියේදී භාවිතා කරන බහුවිධ ඇස්තමේන්තු (multiple imputations) 20 සිට 30 දක්වා වැඩි කරන ලද අතර, මෙමඟින් ඡන්ද ඇස්තමේන්තු වල නිරවද්‍යතාවයේ සහ දෝෂ ආන්තිකයන්හි සුළු වර්ධනයක් ඇති කර දෙයි.

MRP යනු විශ්ලේෂණයට කුඩා සාම්පල භාවිත කිරීම සඳහා වෙනත් රටවල ඡන්ද ආයතන විසින් සුලබව භාවිත කරනු ලබන ක්‍රමයකි, විශේෂයෙන් YouGov විසින් එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් ජනමත විචාරණයේ සහ මෑත කාලීන එක්සත් රාජධානියේ මහ මැතිවරණයේ ප්‍රතිඵල පුරෝකථනය කිරීමට මෙම ක්‍රමය භාවිතා කළේය. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.